# බෞද්ධ අධ්‍යාපනය සහ ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපනය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති,**
**බෙල්ලන්විල රජමහා විහාරාධිපති, අතිපූජ්‍ය මහාචාර්ය**
**බෙල්ලන්විල විමලරතන ස්වාමීන් වහන්සෙ**

බෞද්ධ අධ්‍යාපන ක්‍රමය සහමුලින් ගොඩනැගී ඇත්තේ ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව පදනම් කොට බව, එහි ඉතිහාසයෙන් අවධාරණය වෙයි. අධ්‍යාපනයෙන් අපේක්ෂිත චරිත වර්ධනය හා බුද්ධිය වර්ධනය යන පරමාර්ථයන් මුදුන් පත් කර ගැනීමෙ ලා එය බලවත් ප්‍රතිෂ්ඨාවක් වන අයුරු ඔවුනතර අන්‍යොන්‍ය වශයෙන් පුගුණ විය යුතු චර්යා ධර්ම පද්ධතියෙන් මනාව පැහැදිලි වෙයි. ගුරුවරුන් වෙත සිප් සතර හදාරණ ශිෂ්‍යයන් විසින් ස්වකීය ආචාර්යවරුන් විෂයෙහි දක්විය යුතු චර්යා ධර්ම වශයෙන් (උට්ඨාන), දක හුනස්නෙන් හැගී සිටීම (උපට්ඨාන), අවශ්‍ය ඇප උපස්ථාන කිරීම (සුස්සූසා), හොඳින් ඇහුම්කන්දීම (පාරිචරියා), අවශ්‍ය සේවා සංග්‍රහ කිරීම (සක්කච්චං සිප්පපටිග්ගහණං), මැනවින් සිප් සතර හැදෑරීම යන දේ දක්නට ලැබෙයි. මෙකී චර්යා ධර්මයන්ගෙන් සමන්විත ශිෂ්‍යයන් විෂයෙහි ආචාර්යවරුන් විසින් (සුවිනීතං විනෙන්ති), මනා ආචාර සමාචාරයෙහි හික්මවීම, (සුගහීතං ගාහාපෙති) මනාද උගතකු බවට පත් කිරීම (සබ්බසිප්පසුතසමයක්ඛායිනො භවන්ති), සියලු ශිල්ප ශ්‍රැත සමයක් කියා දීම, (මිත්තාමච්චෙසු පටිවේදෙන්ති) හිතමිතුරු සමාජයට හඳුන්වා දීම, (දිසාසු පරිත්තානං කරොන්ති) සියලු දිශාවන්හි ආරක්ෂා කිරීම යන දේ ඉටු කරන බව සඳහන් වෙයි.[1]